# ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණ දත්ත ප්‍රකාශය

54 වන ප්‍රකාශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ISSN 1391- 3050



ශ්‍රී ලංකාවේ ශ්‍රමබලකාය, රැකියා නියුක්තිය සහ රැකියා වියුක්තිය වැනි අතිශය වැදගත් වූ ලාක්‍ෂණිකයන්හි විවිධ වූ මට්ටම් සහ උපනතීන් ගණනය කිරීම, ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය පැවැත්වීම මගින් සිදු කරනු ලබන අගනා කර්තව්‍යයකි. 1990 වසරෙහි පළමු වන කාර්තුවේ සිට ආරම්භ කරන ලද මෙම සමීක්ෂණය මගින්, සෑම වසරකම, සෑම කාර්තුවක් සඳහාම සුපුරුදු ලෙස ශ්‍රමබලය හා සම්බන්ධ වාර්තා මෙලෙස ඉදිරිපත් කර ඇත.

2011 පළමුවැනි කාර්තුව සඳහා ක්ෂේත්‍රයෙන් දත්ත ලබා ගැනීම 2011 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාස 3 තුලදී සිදු කරන ලදි. උතුරු පළාතද ආවරණය වන පරිදි සමීක්ෂණය සිදු කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම්කර තිබුණද, උතුරු පළාතේ ඇතැම් දිස්ත්‍රික්කවල නැවත පදිංචි කරවීම් සිදුවෙමින් පවතින බැවින්, සමීක්ෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කර ගැනීමට ප්‍රායෝගික හා තාක්‍ෂණික ගැටළු මතුවිය. එබැවින් මෙම කාර්තුව සඳහා ප්‍රකාශිත මෙම දත්ත ප්‍රකාශනයේ ශ්‍රමබල ඇස්තමේන්තු සඳහා උතුරු පළාත ආවරණයවී නොමැති බව සැලකිය යුතුය.

## ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය

**ශ්‍රමබලය : අදාල යොමු සතිය තුල රැකියා නියුක්ත සහ රැකියා වියුක්ත වයස අවුරුදු 10 සහ ඊට වැඩි ජනගහනය**

**ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය : ශ්‍රමබලයට අයත්වන පුද්ගලයින් සංඛ්‍යාව වයස අවුරුදු 10 සහ ඊට වැඩි ජනගහනයට ඇති අනුපාතය**

**වගුව 1: ස්ත්‍රී/පුරුෂ භාවය සහ අංශය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය - (2011 -1 කාර්තුව)**

| අංශය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| එකතුව | 8133459 | 100.0 | 5283825 | 65.0 | 2849633 | 35.0 |
| නාගරික | 931660 | 100.0 | 656085 | 70.4 | 275575 | 29.6 |
| ග්‍රාමීය | 6801360 | 100.0 | 4409078 | 64.8 | 2392282 | 35.2 |
| වතු | 400439 | 100.0 | 218662 | 54.6 | 181777 | 45.4 |

**වගුව 2 : ස්ත්‍රී/පුරුෂ භාවය සහ අංශය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය - (2011 -1 කාර්තුව)**

| අංශය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| එකතුව | 8816313 | 100.0 | 2739314 | 31.1 | 6077000 | 68.9 |
| නාගරික | 1311166 | 100.0 | 406905 | 31.0 | 904262 | 69.0 |
| ග්‍රාමීය | 7158839 | 100.0 | 2205091 | 30.8 | 4953748 | 69.2 |
| වතු | 346309 | 100.0 | 127318 | 36.8 | 218990 | 63.2 |

වගුව 1 න් පැහැදිලි වන පරිදි 2011 පළමුවැනි කාර්තුව තුලදී, ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය (ශ්‍රමබලකාය) මිලියන 8.1 ක් ලෙස ඇස්තමේන්තු විය. එයින් 65.0% ක් පුරුෂ පක්‍ෂය ලෙසද, 35.0% ක් ස්ත්‍රී පක්‍ෂය ලෙසද වාර්තා විය. ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය අතරින් 31.1% ක් පුරුෂයින් වූ අතර 68.9% ක් ස්ත්‍රීන් වූ බව වගුව 2 මගින් පැහැදිලි කරයි.

**රූපය 1 : ආර්ථික වශයෙන් ක්‍රියාශීලී/ක්‍රියාශීලී නොවන ජනගහන ව්‍යාප්තිය**







**වගුව 3 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයන් (2000 - 2011 -1 කාර්තුව)**

| වසර | ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| 2000 | 50.3 | 67.2 | 33.9 |
| 2001 | 48.8 | 66.2 | 31.9 |
| 2002 | 50.3 | 67.9 | 33.6 |
| 2003 | 49.7 | 67.5 | 32.6 |
| 2004 | 49.6 | 67.2 | 33.0 |
| 2005 | 49.3 | 67.3 | 32.6 |
| 2006 | 51.2 | 68.1 | 35.7 |
| 2007 | 49.8 | 67.8 | 33.4 |
| 2008 | 50.2 | 67.9 | 34.3 |
| 2009 | 49.2 | 66.7 | 33.7 |
| 2010 | 48.6 | 67.3 | 32.1 |
| 2011 කා.1 | 48.8 | 66.2 | 33.2 |

*(උතුරු නැගෙනහිර පළාත් හැර)*

වසර 2000 සිට ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයන්හි හැසිරීම් රටාව වගුව 3 මගින් නිරූපනය වෙයි. 2011 පළමුවැනි කාර්තුවේදී ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය පුරුෂ පක්‍ෂය තුල 66.2% ක ප්‍රතිශත අගයක පැවති අතර, ස්ත්‍රී පක්ෂය තුල 33.2% ක ප්‍රතිශත අගයක් ගෙන තිබිණි. පුරුෂ පක්‍ෂය තුල ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය ස්ත්‍රී පක්‍ෂයේ ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයට වඩා දෙගුණයකට ආසන්න අගයක පැවති බව මෙවර නිරීක්‍ෂණය වන වැදගත් කරුණකි.

**වගුව 4 : වයස් කාණ්ඩ හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයන් - (2011 -1 කාර්තුව)**

| වයස් කාණ්ඩ අවු: | ස්ත්‍රී / පුරුෂ භාවය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 48.0 | 65.9 | 31.9 |
| 15 - 19 | 16.8 | 22.9 | 10.7 |
| 20 - 24 | 54.5 | 73.7 | 37.5 |
| 25 - 29 | 64.3 | 92.9 | 41.9 |
| 30 - 34 | 65.6 | 95.8 | 40.0 |
| 35 - 39 | 69.1 | 95.7 | 45.8 |
| 40 - 44 | 74.0 | 96.6 | 51.4 |
| 45 - 49 | 70.1 | 93.9 | 51.4 |
| 50 - 54 | 65.0 | 88.9 | 43.4 |
| 55 - 59 | 58.9 | 81.3 | 37.9 |
| 60+ | 27.5 | 42.8 | 14.9 |

සෑම වයස් කාණ්ඩයකම ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය, ස්ත්‍රී පක්‍ෂයට සාපේක්‍ෂව පුරුෂ පක්‍ෂය තුල බෙහෙවින් වැඩි බව වගුව 4 න් නිරීක්‍ෂණය කළහැක.

පුරුෂ පක්‍ෂයේ උපරිම ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය වයස අවුරුදු (40-44) කාණ්ඩයෙන් මෙවර වාර්තා වූ අතර, ස්ත්‍රී පක්‍ෂයෙන් උපරිම ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය වාර්තා වූයේ වයස අවුරුදු (40-44) සහ (45-49)අතර වයස් කාණ්ඩයන්ගෙනි.

# රැකියා නියුක්තිය

**රැකියා නියුක්තිය : අදාල යොමු සතිය තුල, වැටුප් හෝ ලාභ පිණිස හෝ පවුලට ආදායමක් ලැබීම සඳහා කිසියම් වැඩක නියැලුණු පුද්ගලයින් ගණන**

**වගුව 5 : සේවයේ නියුතු ප්‍රධාන කර්මාන්තය අනුව රැකියා නියුක්ති ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය - (2010 -1 කාර්තුව - 2011 -1 කාර්තුව)**

| කාර්තුව | එකතුව | ප්‍රධාන කර්මාන්ත අංශය | | |
|---|---|---|---|---|
| | | කෘෂි කර්මාන්ත | නිෂ්පාදන | සේවා |
| ජන.-පෙබ.-මාර්තු<br>(2010 1 කාර්තුව) | 7725753<br>100.0 | 2600463<br>33.7 | 1911428<br>24.7 | 3213861<br>41.6 |
| අප්‍රේ.-මැයි.-ජුනි<br>(2010 2 කාර්තුව) | 7613267<br>100.0 | 2439391<br>32.0 | 1795204<br>23.6 | 3378672<br>44.4 |
| ජුලි-අගෝ.-සැප්.-<br>(2010 3 කාර්තුව) | 7578174<br>100.0 | 2367294<br>31.2 | 1850442<br>24.4 | 3360438<br>44.3 |
| ඔක්.-නොවැ.-දෙසැ.<br>(2010 4 කාර්තුව) | 7909178<br>100.0 | 2672472<br>33.8 | 1909857<br>24.1 | 3326849<br>42.1 |
| ජන.-පෙබ.-මාර්තු<br>(2011 1 කාර්තුව) | 7783574<br>100.0 | 2511427<br>32.3 | 1951202<br>25.1 | 3320945<br>42.7 |

**සටහන : A,B,C.......Q වශයෙන් සඳහන් කරනු ලබන මෙම වර්ගීකරණය ජාත්‍යන්තර වර්ගීකරණය ISIC (Rev3) අනුව සකස්වී ඇත.**

**කෘෂිකාර්මික :**

1. කෘෂිකාර්මික (A)
2. ධීවර හා වන (B)

**නිෂ්පාදන කර්මාන්ත :**

1. නිෂ්පාදන (D)
2. ඉදිකිරීම් (F)
3. පතල් සහ කැණීම් (C)
4. විදුලිය, ගෑස් සහ ජල සම්පාදනය(E)

**සේවා :**

1. තොග හා සිල්ලර වෙළඳම, මෝටර් රථ, යතුරු පැදි සහ ගෘහ උපකරණ අ□ත්වැ□යාව (G)
2. හෝටල් සහ නවාතැන්පලවල් (H)
3. ගමනාගමනය, ගබඩා සහ පණිවුඩ හුවමාරුව (I)
4. මුල්‍ය ගනුදෙනු, දේපල වෙළඳම, කුලියට දීමේ ව්‍යාපාරික සේවා. (J,K)
5. රාජ්‍ය පරිපාලන, ආරක්‍ෂක සහ අත්‍යාවශ්‍ය සේවා රාජකාරි (L)
6. අධ්‍යාපනය (M)
7. සෞඛ්‍ය සහ සමාජ සේවා (N)
8. වෙනත් මානව සමාජ සහ පොදුසේවා (O)
9. ගෘහ සේවාවල නියුතුවූවන් (P)
10. තැනින් තැන ඇවිද කුලි වැඩ කරන්නන්
11. වෙනත් ප්‍රාදේශීය සංවිධාන (Q)
12. ප්‍රමාණවත් ලෙස විස්තර නොවුණු කර්මාන්ත

රැකියා නියුක්තිකයින් සේවයේ නියුතුව සිටි ප්‍රධාන කර්මාන්ත අංශයන් යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිශත ව්‍යාප්තිය 2010 පළමුවැනි කාර්තුවේ සිට 2011 පළමුවැනි කාර්තුව දක්වා වාර්තා වූ අයුරු වගුව 5 න් නිරූපනය වෙයි.

ඒ අනුව, 2011 පළමුවැනි කාර්තුව තුල ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයින් ගණන මිලියන 7.8 කි. එයින් 42.7% ක් සේවා අංශයේ රැකියා නියුක්තිකයින් වූ අතර, 32.3% ක් කෘෂිකර්ම අංශයේද, 25.1% ක් නිෂ්පාදන අංශයේද රැකියා නියුක්තිකයින් වූහ.

**වගුව 6 : සේවා තත්වය සහ කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන අංශයන්හි සේවා නියුක්තිය අනුව ප්‍රතිශත ව්‍යාප්තිය - (2011 -1 කාර්තුව)**

| රැකියාවේ සේවා තත්වය | එකතුව | | අංශය | | | |
|---|---|---|---|---|---|---|
| | | | කෘෂිකාර්මික | | කෘෂිකාර්මික නොවන | |
| | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | 7783574 | 100.0 | 2511427 | 32.3 | 5272147 | 67.7 |
| සේවක | 4208368 | 100.0 | 727228 | 17.3 | 3481139 | 82.7 |
| රජයේ | 1057555 | 100.0 | 110189 | 10.4 | 947366 | 89.6 |
| පෞද්ගලික | 3150813 | 100.0 | 617039 | 19.6 | 2533774 | 80.4 |
| සේවායෝජක | 239959 | 100.0 | 33672 | 14.0 | 206284 | 86.0 |
| තමාගේම වැඩ කටයුතු කරන්නා | 2484054 | 100.0 | 1152978 | 46.4 | 1331076 | 53.6 |
| පවුලේ ආර්ථිකයට දායකවන්නන් | 851196 | 100.0 | 597548 | 70.2 | 253648 | 29.8 |

වැටුප් ලබන රජයේ හෝ පුද්ගලික අංශයේ සේවකයින් අතුරින් වැඩි ප්‍රතිශතයක් රැකියාවේ නිරත වූයේ කෘෂිකාර්මික නොවන අංශ තුල බව වගුව 6 න් නිරීක්ෂණය වෙයි. එමෙන්ම කෘෂිකාර්මික අංශයට වඩා කෘෂිකාර්මික නොවන අංශය තුල, සේවායෝජකයින් වශයෙන් රැකියාවේ නියුක්තව සිටි පිරිසද ඉතා වැඩිය. නමුත් පවුලේ ආර්ථිකයට දායකවන්නන් ලෙස වැඩි පිරිසක් රැකියාවේ නියුක්තව සිටියේ කෘෂිකර්ම අංශයේය.

**වගුව 7 : සේවයේ නියුතු ප්‍රධාන කර්මාන්ත අංශය අනුව රැකියා නියුතු ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය - (2011 -1 කාර්තුව)**

| ප්‍රධාන කර්මාන්ත අංශය | එකතුව | ස්ත්‍රී / පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 100.0 | 100.0 | 100.0 |
| කෘෂිකර්මාන්තය | 32.3 | 29.3 | 38.0 |
| නිෂ්පාදන කර්මාන්ත | 25.1 | 25.0 | 25.1 |
| සේවා | 42.7 | 45.6 | 36.9 |

ස්ත්‍රීන් මෙන්ම පුරුෂයින්ද වැඩි ප්‍රතිශතයකින් රැකියා නියුක්තව සිටියේ සේවා අංශය තුලය. රැකියා නියුක්ත ස්ත්‍රීන් ගෙන් 38% ක් කෘෂිකර්ම අංශයේ රැකියා නියුක්තව සිටි අතර, රැකියා නියුතු පුරුෂයින් ගෙන් කෘෂිකර්ම අංශය තුල රැකියා නියුක්තව සිටියේ 29.3% ක පිරිසකි.

# රැකියා වියුක්තිය

**විරැකියා අනුපාතය : රැකියා වියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව, ශ්‍රමබලකායට ඇති අනුපාතයේ ප්‍රතිශතය**

**රැකියා විරහිත පුද්ගලයින් : යොමු සතිය තුල රැකියාවක් බලාපොරොත්තුවෙන් රැකියාවක් සොයා ගැනීමට කටයුතු කළ රැකියාවක් නොමැතිව සිටි පුද්ගලයින් ගණන**

**රූපය 2 : 95% විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence intervals) තුල විරැකියා අනුපාතයන්හි හැසිරීම (2010 ජනවාරි - 2011 මාර්තු)**




2011 පළමුවැනි කාර්තුව තුලදී 349,885 ට ආසන්න පිරිසක් රැකියා විරහිතව පසුවූ බවට ඇස්තමේන්තු ලැබී ඇත. 2011 පළමුවැනි කාර්තුවේ වාර්තා වූ විරැකියා අනුපාතය 4.3% කි. *(උතුරු පළාත හැර)*

**නියැදුම් දෝෂයන්** * පිළිබඳව සැලකිලිමත් වීමේදී, 2010/2011 විවිධ කාල පරාස වලදී වාර්තා වූ විරැකියා අනුපාතයන්හි, සංඛ්‍යානමය වශයෙන් සුවිශේෂි වූ වෙනසක් ප්‍රදර්ශනය නොවන බව රූපය 2 විමසිලිමත්ව පරීක්‍ෂා කිරීමෙන් පැහැදිලිව පෙනියනු ඇත.

**වගුව 8 : ස්ත්‍රී/පුරුෂ භාවය සහ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අනුව විරැකියා අනුපාතයන් - (2011 -1 කාර්තුව)**

| අධ්‍යාපන මට්ටම | විරැකියා අනුපාතය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 4.3 | 3.0 | 6.7 |
| අ.පො.ස. (සා.පෙ.) දක්වා | 2.5 | 2.0 | 3.5 |
| අ.පො.ස. (සා.පෙ.)සමත් | 5.3 | 4.2 | 7.5 |
| අ.පො.ස. (උ.පෙ.) හා ඉන් ඉහළ | 10.0 | 6.4 | 14.3 |

**වගුව 9 : ස්ත්‍රී/පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව විරැකියා අනුපාතයන් - (2011 -1 කාර්තුව)**

| වයස් කාණ්ඩ | ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 4.3 | 3.0 | 6.7 |
| 15 - 24 | 15.7 | 13.4 | 20.0 |
| 25 - 29 | 9.6 | 4.6 | 18.2 |
| 30 + | 1.4 | 0.9 | 2.4 |

**රූපය 3 : ස්ත්‍රී/පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව විරැකියා අනුපාතයන් - (2011 -1 කාර්තුව)**




දිවයිනේ සමස්ත විරැකියා අනුපාතය ගණනය කිරීමේදී ස්ත්‍රී පක්‍ෂය තුල 6.7% ක් සහ පුරුෂ පක්‍ෂය තුල 3.0% ක් ලෙසින් විරැකියා අනුපාතයන් ඇස්තමේන්තු විය. කෙසේ වෙතත්, වයස අවුරුදු (15-24) අතර. තරුණ පිරිස් තුලින් අනෙකුත් වයස් කාණ්ඩ වලට සාපේක්‍ෂව වැඩිම විරැකියා අනුපාතයක් වාර්තා විය. එහි අගය 15.7% කි. එම තරුණ වයස් කාණ්ඩයේ පසුවන පුරුෂ පක්‍ෂයේ විරැකියා අනුපාතය 13.4% ක් වූ අතර, ස්ත්‍රී පක්‍ෂය තුල එම අගය 20.0% ක් විය. සෑම වයස් කාණ්ඩයක් තුලම ස්ත්‍රී පක්‍ෂයේ විරැකියා අනුපාතය පුරුෂ පක්‍ෂයේ විරැකියා අනුපාතයට වඩා විශාල අගයක් ගෙන තිබිණි.

ඉහළම විරැකියා අනුපාතයක් වාර්තා වුයේ අ.පො.ස. (උ.පෙ.) සහ ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිස් තුලය. එය 10.0% ක අගයක් ගෙන තිබේ. අ.පො.ස. (උ.පෙ.) සහ ඉන් ඉහළ විභාගය සමත් පුරුෂ පක්‍ෂයේ විරැකියා අනුපාතය 6.4% ක්ව පැවති අතර, ස්ත්‍රී පක්‍ෂය තුල එය 14.3% ක්ව තිබිණි. ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිතව පසුවන ස්ත්‍රී පක්‍ෂය තුල විරැකියා අනුපාතය, එම පසුබිමෙහිම පසුවන පුරුෂ පක්‍ෂය තුල විරැකියා අනුපාතයට වඩා ඉතා ඉහළ බව මෙයින් පෙන්නුම් කරයි. (වගුව 8)

* ***නියැදුම් දෝෂය***

*සම්පූර්ණ ජනගහනය අතුරින් ලබා ගන්නා අගයන් සහ ජනගහනයෙන් කොටසක් තෝරාගෙන කරනු ලබන නියැදි සමීක්‍ෂණයකින් ලබා ගන්නා ඇස්තමේන්තු අගයන් අතර වෙනසක් දැකිය හැක. මෙම වෙනස නියැදුම් දෝෂය නිසා සිදු වන්නක් වන අතර, ඇස්තමේන්තු ගත අගයන්හි සම්මත දෝෂයෙන් (standard error) මෙය පිළිබිඹු කරයි.*

***www.statistics.gov.lk*** ***දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ ශ්‍රමබල පුවරුව හරහා යමින් වැඩිදුර විස්තර මෙන්ම සංකල්ප හා අර්ථ දැක්වීම් පිළිබඳ පැහැදිලි කිරීම් කරගත හැක.***

## තෝරාගත් ශ්‍රමබල දර්ශකයන් (උතුරු නැගෙනහිර පළාත් හැර)
## (2003 - 2011 පළමුවැනි කාර්තුව)

| | වසර | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2010 කා.1 | 2011 කා.1 | #2011 කා.1 |
| ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය | | | | | | | | | | | |
| ස්ත්‍රී / පුරුෂ භාවය අනුව | | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 49.7 | 49.6 | 49.3 | 51.2 | 49.8 | 50.2 | 49.2 | 48.6 | 49.1 | 48.8 | 48.0 |
| පුරුෂ | 67.5 | 67.2 | 67.3 | 68.1 | 67.8 | 67.9 | 66.7 | 67.3 | 67.8 | 66.2 | 65.9 |
| ස්ත්‍රී | 32.6 | 33.0 | 32.6 | 35.7 | 33.4 | 34.3 | 33.7 | 32.1 | 32.7 | 33.2 | 31.9 |
| පදිංචි ප්‍රදේශය අනුව | | | | | | | | | | | |
| එකතුව | 49.7 | 49.6 | 49.3 | 51.2 | 49.8 | 50.2 | 49.2 | 48.6 | 49.1 | 48.8 | 48.0 |
| නාගරික | 45.1 | 45.6 | 46.2 | 45.3 | 45.0 | 46.3 | 43.9 | 42.5 | 44.1 | 42.5 | 41.5 |
| ග්‍රාමීය | 50.3 | 50.3 | 49.7 | 52.1 | 50.4 | 50.7 | 49.8 | 49.5 | 49.8 | 49.7 | 49.0 |
| විරැකියා අනුපාතය | | | | | | | | | | | |
| ස්ත්‍රී / පුරුෂ භාවය අනුව | | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 8.1 | 8.1 | 7.2 | 6.5 | 6.0 | 5.2 | 5.7 | 4.9 | 5.1 | 4.2 | 4.3 |
| පුරුෂ | 6.0 | 6.0 | 5.3 | 4.7 | 4.3 | 3.6 | 4.3 | 3.5 | 3.5 | 3.0 | 3.0 |
| ස්ත්‍රී | 12.3 | 12.1 | 10.7 | 9.7 | 9.0 | 8.0 | 8.2 | 7.5 | 7.9 | 6.3 | 6.7 |
| තෝරාගත් වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | | | | | | |
| 20 - 29 | 19.1 | 18.6 | 16.0 | 15.9 | 15.0 | 13.2 | 15.1 | 13.7 | 14.5 | 12.0 | 12.8 |
| 20 - 24 | 25.8 | 25.2 | 22.4 | 21.0 | 21.1 | 17.8 | 21.0 | 18.9 | 20.1 | 15.8 | 16.4 |
| 25 - 29 | 11.4 | 11.1 | 9.4 | 11.0 | 9.4 | 9.0 | 10.1 | 9.1 | 9.8 | 8.7 | 9.6 |
| තෝරාගත් අධ්‍යාපන මට්ටම් අනුව | | | | | | | | | | | |
| අ.පොස.(උ.පෙල.) සහ ඉන් ඉහළ | | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 16.0 | 15.7 | 12.2 | 11.6 | 11.8 | 9.9 | 10.8 | 11.3 | 11.9 | 9.2 | 10.0 |
| පුරුෂ | 10.1 | 9.6 | 7.9 | 6.9 | 6.6 | 5.6 | 6.6 | 7.5 | 7.8 | 5.8 | 6.4 |
| ස්ත්‍රී | 22.4 | 22.5 | 17.1 | 16.8 | 17.5 | 14.4 | 15.1 | 15.6 | 16.4 | 13.1 | 14.3 |
| රැකියා නියුක්ත ජනගහනය | | | | | | | | | | | |
| ස්ත්‍රී / පුරුෂ භාවය අනුව | | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 6609466 | 6704006 | 6788119 | 7105322 | 7041874 | 7174706 | 7139537 | 7235641 | 7287199 | 7351776 | 7783574 |
| පුරුෂ | 4496136 | 4512082 | 4546397 | 4610643 | 4653067 | 4663277 | 4609198 | 4770376 | 4771572 | 4770710 | 5125489 |
| ස්ත්‍රී | 2113330 | 2191924 | 2241722 | 2494679 | 2388807 | 2511429 | 2530339 | 2465265 | 2515626 | 2581066 | 2658085 |
| සේවයේ නියුතු කර්මාන්තය (ප්‍රතිශතයක් ලෙස) | | | | | | | | | | | |
| එකතුව | 6609466 | 6704006 | 6788119 | 7105322 | 7041874 | 7174706 | 7139537 | 7235641 | 7287199 | 7351776 | 7783574 |
| % | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) |
| කෘෂිකර්මාන්ත | 2223691 | 2215282 | 2059293 | 2287268 | 2202098 | 2344415 | 2318621 | 2353598 | 2455665 | 2353311 | 2511427 |
| % | (33.6) | (33.0) | (30.3) | (32.2) | (31.3) | (32.7) | (32.5) | (32.5) | (33.7) | (32.0) | (32.3) |
| නිෂ්. කර්මාන් | 1539035 | 1663383 | 1787274 | 1889953 | 1873857 | 1888004 | 1822685 | 1777129 | 1835359 | 1879606 | 1951202 |
| % | (23.3) | (24.8) | (26.3) | (26.6) | (26.6) | (26.3) | (25.5) | (24.6) | (25.2) | (25.6) | (25.1) |
| සේවා | 2846740 | 2825341 | 2941552 | 2928101 | 2965919 | 2942288 | 2998231 | 3104913 | 2996174 | 3118859 | 3320945 |
| % | (43.1) | (42.1) | (43.3) | (41.2) | (42.1) | (41.0) | (42.0) | (42.9) | (41.1) | (42.4) | (42.7) |
| සතියකට වැඩ කරන පැය ගණන අනුව (ප්‍රතිශතයක් ලෙස) | | | | | | | | | | | |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| 0 • | 7.3 | 5.3 | 4.9 | 6.7 | 6.5 | 7.4 | 7.9 | 6.1 | 3.8 | 3.7 | 4.1 |
| 1 - 9 | 1.8 | 1.7 | 1.6 | 1.9 | 1.5 | 2.2 | 2.4 | 1.8 | 1.3 | 1.5 | 1.5 |
| 10 - 39 | 32.9 | 28.4 | 27.9 | 28.6 | 28.3 | 29.2 | 29.0 | 38.6 | 28.8 | 29.6 | 29.4 |
| 40+ | 58.0 | 64.7 | 65.7 | 62.8 | 63.7 | 61.2 | 60.8 | 63.5 | 66.0 | 65.2 | 65.0 |

* උතුරු පළාත හැර

• රැකියාවක් තිබූ නමුත් යොමු කාලය තුල රැකියාවෙහි යෙදී නොමැත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 15/12, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07
දුරකථන : 2695291, ෆැක්ස් : 94-11-2697594, ඊමේල් : sample.survey @ statistics.gov.lk
අන්තර්ජාලය: www.statistics.gov.lk